ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2017 ඔක්තෝබර් 26** |

## වසර 2020 අග භාගය වන විට බලපත්‍රලාභී බැංකු වල අවම ප්‍රාග්ධනය ඉහළ නැංවීම

ශක්තිමත් සහ ගතික බැංකු අංශයක් තහවුරු කරලීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉහළ නංවන ලදී. මේ සඳහා සලකා බැලෙන ප්‍රාග්ධනය, ප්‍රධාන වශයෙන්ම ඉහළ ගුණාත්මක බවකින් යුතු, අලාභ දරා ගැනීමේ ඉහළ ධාරිතාවයකින් යුක්ත ප්‍රාග්ධනය වේ.

අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉහළ නැංවීම, බැංකු සතු ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා, ශ්‍රී ලංකාව තුළ බාසල් III රාමුව ක්‍රියාත්මක කිරීමට උපකාර වන අතර, බැංකු අංශය තුළ ඒකාබද්ධවීම් සිදුවීම සඳහා ද මෙහෙයවීමක් ඇති කළ හැකිය. ඒ අනුව, ස්ථාපනය කිරීමට හෝ සංස්ථාපනය කිරීමට නියමිත නව බැංකු විසින් පහත සඳහන් ප්‍රාග්ධන අවශ්‍යතාවයන් වහා ක්‍රියාත්මක වන පරිදි සපුරාලීම අත්‍යාවශ්‍ය වේ.

**නව බැංකු සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන්**

| බැංකු විශේෂය | අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය (රු. බිලියන) |
|---|---|
| බලපත්‍රලාභී දේශීය වාණිජ බැංකු | 20 |
| බලපත්‍රලාභී දේශීය විශේෂිත බැංකු | 7.5 |
| ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද බැංකු (විදේශීය බැංකු) | 10 |

අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කරගැනීම පිණිස මේ වන විටත් සංස්ථාපිත බැංකු සඳහා වසර 03 ක කාලයක් ලබා දී තිබේ. මෙම කාලය තුළ දී, බැංකු විසින් නව ප්‍රාග්ධනය හඳුන්වාදීමේ සැළසුම් ක්‍රියාත්මක කිරීමත්, අවශ්‍ය වන්නේ නම් ප්‍රතිව්‍යුහගත

කිරීම හෝ ඒකාබද්ධවීම සඳහා පියවර ගැනීමත් අපේක්ෂා කෙරේ. ඒ අනුව, දැනට සංස්ථාපිත බැංකු සඳහා 2020.12.31 දින සිට බලපැවැත්වෙන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් පහත සඳහන් පරිදි වේ.

**දැනට ස්ථාපිත බැංකු සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන්**

| බැංකු විශේෂය | අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය (රු. බිලියන) |
|---|---|
| බලපත්‍රලාභී දේශීය වාණිජ බැංකු | 20 |
| බලපත්‍රලාභී දේශීය විශේෂිත බැංකු | 7.5 |
| විදේශීය බැංකු<br>• රු. බිලියන 100 දක්වා වත්කම් සහිත<br>• රු. බිලියන 100 ඉක්මවූ වත්කම් සහිත | <br>05<br>10 |

අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන්හි ගුණාත්මක භාවය ඉහළ නැංවීම, බැංකු වඩාත් ශක්තිමත් කරවීම සඳහා මග පාදන අතර, එමගින් බැංකු පද්ධතිය මෙන්ම ජාතික ආර්ථිකය සතු ශක්‍යතාවය සහ ස්ථාවරත්වය ද සුරක්ෂිත වනු ඇතැ'යි ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.